මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244. Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*
e-mail: psc.cp.gov@gmail.com

| | | | |
|---|---|---|---|
| කාර්යාලය / காரியாலயம் / Office: 081-2213097 | ලේකම් / செயலாளர் / Secretary: 081-2213096 | සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary: 081-5631321 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 081-2213082 |


මගේ අංකය / எனது இல. / My No.: CPC/PSC/8/3/42-2020
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2021.01. 04

මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්,
මධ්‍යම පළාතේ ආණ්ඩුකාර ලේකම්,
මධ්‍යම පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
මධ්‍යම පළාතේ සියළු අමාත්‍යාංශය ලේකම්වරු,
මධ්‍යම පළාතේ සියළු දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
මධ්‍යම පළාතේ සියළු ආයතන ප්‍රධානීන්.

**<u>2019 අදියර II හා III යටතේ පුහුණුවට බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරී සේවයට බඳවා ගැනීමට සුදුසුකම් පරීක්ෂාව සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවීම.</u>**

උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථිර පදනම මත මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණය **2021.01.11** හා 12 යන දිනවලදී මෙම කොමිෂන් සභා කාර්යාලයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර, අදාල කැඳවීමේ ලිපි මේ වන විට ඔවුන්ගේ පෞද්ගලික ලිපිනයන්ට යොමු කර ඇත. දැනට උද්ගතව පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය මත එම ලිපි ලැබීම ප්‍රමාදවීම සිදුවිය හැකි බැවින් ඔබ ආයතන/දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය යටතේ **2019** අදියර **II** හා **III** යටතේ පුහුණුවට බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් ඇමුණුම් 01,02 හි සහ පහත කරුණු සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. ඒ ඒ උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ සම්මුඛ පරීක්ෂණයට අදාල දිනයන් හා වේලාවන් ***www.psc.cp.gov.lk*** වෙබ් අඩවිය තුල පල කර ඇත.

**02.** සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් <u>ලිපි ලේඛනවල මුල්පිටපත් සහ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද එම ලිපි ලේඛනවල ඡායා පිටපත් කට්ටලයක්ද</u> රැගෙන, නිලධාරයා සඳහා වෙත <u>වෙන්කර ඇති දිනයේදී නියමිත වේලාවට මිනිත්තු 30 කට පමණ පෙර</u> මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත පැමිණෙන ලෙසත්, සෞඛ්‍යාරක්ෂිත හේතු මත අදාල නොවන ලේඛන/ගොනු ආදිය රැගෙන ඒමෙන් වලකින ලෙසත් අදාල නිලධරයන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

- **I.** උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණුව සඳහා කැඳවීමේ ලිපිය/ දිස්ත්‍රික් ලේකම් විසින් අභ්‍යාසලාභී පුහුණුව සඳහා ආයතනයක් වෙත අනුයුක්ත කරනු ලැබූ ලිපිය
- **II.** උප්පැන්න සහතිකය
- **III.** ජාතික හැඳුනුම්පත
- **IV.** නමේ වෙනසක් ඇත්නම් එය සනාථ කිරීමට දිවුරුම් ප්‍රකාශනයක්
- **V.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධි සහතිකය (උපාධි විෂයයන් හා ප්‍රතිඵල සටහන් සහිත විස්තරාත්මක සහතිකය)
- **VI.** උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණු කාලසීමාව තහවුරු කෙරෙන, ලබා ගෙන ඇති නිවාඩු විස්තර ඇතුලත් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉදිරිපත් කරන නිර්දේශය (ඇමුණුම් 01) (මුල්පිටපත පමණක් රැගෙන ඒම ප්‍රමාණවත්ය.)
- **VII.** මධ්‍යම පළාත තුළ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීම සඳහා මනාපය පළ කිරීමේ ප්‍රකාශය. (ඇමුණුම් 02)
- **VIII.** මධ්‍යම පළාත තුළ පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ සහතිකය. (මුල්පිටපත පමණක් රැගෙන ඒම ප්‍රමාණවත්ය.)
- **IX.** උපාධිය හදාරන ලද භාෂා මාධ්‍යයට අතිරේකව වෙනත් භාෂා හැකියාවන් සනාථ කෙරෙන සහතික (ඇත්නම්)
- **X.** පරිගණක සාක්ෂරතාවය සනාථ කෙරෙන සහතික (ඇත්නම්)

**XI.** පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා වැනි අතිරේක අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් ඇත්නම් ඒ බව සනාථ කෙරෙන සහතික

03. තවද, රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා සෞඛ්‍ය අංශවල උපදෙස් අනුව මෙම සම්මුඛ පරීක්ෂණ කටයුතු කෙරෙන බැවින් සම්මුඛ පරීක්ෂණයට සහභාගිවන නිලධරයන්, පහත සෞඛ්‍යාරක්ෂිත පිලිවෙත් අනුගමනය කල යුතු බවද අවධාරනය කරමි.

**I.** මුඛ ආවරණ නිසිලෙස පැලද සිටිම
**II.** අදාළ නිලධාරියා පමණක් සම්මුඛ පරීක්ෂණ කාර්යාල භූමියට ඇතුළුවීම.
**III.** දෑත් සෝදා සම්මුඛ පරීක්ෂණ කාර්යාල භූමියට ඇතුළුවීම.
**IV.** පුද්ගල දුරස්ථභාවය සහිතව කටයුතු කිරිම.

ටී.ජේ.ඩී.ඩබ්ලිව්. දයානන්ද,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.